

# මිතුරාගේ දිනපොත



**ආචාර්ය පාලිත ගනේවත්ත**

**මගේ** සමීප මිතුරකු වන නරුමසේකර හදිසියේම අසනීප වී රෝහග් ගත වූයේ අප කිසිවකු බලාපොරොත්තු නොවූ පරිදිය.

ඔහුගේ හදිසි අසනීපයට හේතු කාරක සොයනු පිණිස විවිධ පරීක්ෂණවලට සහභාගි වෙමින් දෙසතියක්ම රෝහලේ ගත කිරීමට ඔහුට සිදුවිය. අවසානයේදී වෛද්‍යවරුන්ගේ නිගමනය වූයේ කිසියම් අසාමාන්‍ය වෛරසයක් ශරීර ගතවීමෙන් ඔහුගේ සිරුරේ එක් පැත්තක අකර්මන්‍යවීමට පටන් ගෙන ඇති බවය.

මෙම ආරංචිය දැනගත් මම බෙහෙවින් බියට පත්විමි. අවිවාහකයකු වූ නරුමසේකර නැවතී සිටියේ රත්මලානේ වෙළෙඳ ආයතනයක සේවය කළ ඔහුගේ මිතුරකු සමගය. ඔහු ළඟින් ඇසුරු කළේ මාත්, උදරපෝෂක නමැති තවත් මිතුරකුත් පමණි. පෞද්ගලික ආයතනයක ලිපිකරුවකු ලෙස සේවය කළ නරුමසේකර

රාත්‍රී කාලයේදී නිතර ලිවීමට පුරුදු වී සිටි බව ඔහු හමුවන්ට ගිය කිහිප වරකදීම මම දුටුවෙමි. ඔහු කුමක් ලියන්නේදැයි විමසූ විට එයට පිළිතුරු දීම අදිමදි කළ ඔහු මා සමඟ පැවසුවේ මේ රටේ සිදුවන සමාජ අසාධාරණ කටයුතු පිළිබඳවය. දේශපාලකයන් හා රටේ ධනවතුන්ට බැණ වදිමින් නිතරම ඔවුන් විවේචනය කළ නරුමසේකර වාසය කළේ සාධාරණ නව ලොවක් උදාවේ යයි සිහින මවමින් යයි මට සිතුණු වාර බොහෝය.

ඔහු රෝහලේ සිටින දෙවන සතියේ දිනක ඔහු බලන්ට ගිය මා විස්මයට පත්වූයේ ඔහු මගෙන් කළ අනපේක්ෂිත ඉල්ලීමක් නිසාය. තම කොට්ටය යට වූ කුඩා පසුම්බියක් වැනි අත්බෑගය ගත් ඔහු මා දෙස මඳ වෙලාවක් බලා සිටියේය. ඔහුගේ හැඳුණුම්පත, මුදල් හා සියළුම වැදගත් ලියවිලි දෙකට තුනට නමා මෙම පසුම්බියේ තබා ගන්නා බව මම කිහිපවරක් දැක ඇත්තෙමි. එය විවෘත කර එයින් යතුරු කැරැල්ලක් එළියට ගත් ඔහු එය මා වෙත පා යළිත් මඳ වේලාවක් මා දෙස බලා සිටියේය. මා යතුරු කැරැල්ල ගත් පසු ඔහු බිඳුන හඬින් මෙසේ කිවේය.

''මගෙ කාමරේ අල්මාරිය අරින්න මේ ලොකු යතුරෙන්. දකුණු පැත්තෙ යටම ලාච්චුවේ ඇති ලොකු ෆයිල් කවරයක්.''
ඉන්පසුව කතාව නවතා බිම බලාගත් ඔහු තම සිතිවිලි එක්තැන් කර ගැනීමට මෙන් මඳ වෙලාවක් නිහඬව සිටියේය.

ඔහු මගෙන් ආයාචනය කළේ එම කවරය තුළ ඇති ඔහු ලියූ දේ සවධානව කියවා ඒ ගැන මගේ අදහස් ඔහුට දන්වන ලෙසය. ඔහු ඒ වග මට පැවසූ අසරණ විලාසය දුටු මා තුළ ඇතිවූයේ දැඩි අනුකම්පාවකි. එදින රාත්‍රියේ ඔහු නැවතී සිටි නිවසට ගිය මට ගෙහිමියා වූ ග්‍රාමභක්ෂක ගේ අවසරය ඇතිව නරුමසේකරගේ කාමරයට ඇතුළු වී ඔහුගේ අල්මාරිය ඇරියෙමි. මා නහය

*<u>මම දකුණු පස යට ලාච්චුව හැර එහි වූ දම්පාට ෆයිල් කවරය එළියට ගත්තෙමි. ඔහු ලියා ඇති පිටු දෙසියයක පමණ සටහන් මා පෙරළා බලන්ට වූයේ විස්මයෙන් බරවූ සිතින් යුතුවය.</u>*

හකුලා ගත්තේ අල්මාරිය විවෘත කළ විගස දැණුනු පුස්ගඳ නිසාය. අල්මාරියේ ඇඳුම් දමන රාක්ක සියල්ලම පාහේ පොත්පත් වලින් පිරී තිබිණ. නරුමසේකර ඉඳහිට පොත් කියවූ බව මා දැන සිටියාය. ඔහු සතුව මෙතරම් පොත් ඇතැයි මම නොසිතුවෙමි.

ඔහු රාත්‍රි කාලවලදී යම් යම් දේ ලියා තබන්නට ඇත්තේ මේ පොත්පත් කියවීමෙන් ඔහු තුළ නැගුණු සිතිවිලි වන්නට බැරි නැත්ද? ඔහු රෝහලට යාමට පෙර ඔහුව හමුවන්ට ගියවිට ලියමින් සිටි දේ ගැන විමසූ විට ඒ ගැන කියන්ට අදිමදි කළත් දැන් ඒ සියල්ල කියවීමේ අවස්ථාව මට උදාවී ඇත. මම දකුණු පස යට ලාච්චුව හැර එහි වූ දම්පාට ෆයිල් කවරය එළියට ගත්තෙමි. ඔහු ලියා ඇති පිටු දෙසියයක පමණ සටහන් මා පෙරළා බලන්ට වූයේ විස්මයෙන් බරවූ සිතින් යුතුවය. උඩින්ම තිබුනේ ඔහු විසින් ඉංග්‍රීසියෙන් ලියන ලද පිටු සියයක පමණ සටහන්ය. එය පෙරළා උඩින් පල්ලෙන් බැලූ මට පෙනී ගියේ රටේ දේශපාලන හා සමාජ සිදුවීම් පිළිබඳව ඔහුගේ අදහස් ඒ පිටුවල සටහන් කර ඇති බවය.

ඔහු මගෙන් ආයාචනය කර සිටියේ ෆයිල් කවරයේ යටින් ඇති ඔහු සිංහලෙන් ලියූ සටහන් කියවා ඒ පිළිබඳව මගේ අදහස් ඔහුට දන්වන ලෙසය. මම ඒ සටහන් ගෙන නරුමසේකර නිතර ලියන්ට පුරුදු වී සිටි ඔහුගේ මේසය ළඟ හිඳගෙන ඒ සටහන් එකින් එක පෙරලුවෙමි. පිටු හැට හැත්තෑවක් පමණ වන එම සටහන් වෙන වෙනම ලියූ කෙටිකතා එකතුවක් ලෙසය මට පෙනී ගියේ. එම කතාවලට ඔහු යොදා තිබුණු නම් පවා මා කියවූයේ මද කුතුහලයකිනි. ඇමතිතුමාගේ වස්තුව,පොලිස් රාළහාමිගේ වස්තුව ආදී වශයෙන් ඔහු යොදා තිබුණු නම් දුටු මට සිහිපත් වූයේ සද්ධර්ම රත්නාවලියේ ඇතුළත් කතා හැඳින්වීමට යොදා තිබුණු නම් ය. මම එක්වරම දැඩි අවධානයකින් පළමු කතාව කියවන්නට පටන් ගත්තෙමි.

නරුමසේකර ගේ දින පොත ළබන කලාපයේ සිට කියවමු.

30 වන පිටෙන්

- එහිදී අවුරුදු හතරක පමණ කාලයක් නාට්‍ය, සංගීතය, නැටුම්, බෙර වාදනය, ගායනය හා රංගනය අඩංගු වැඩමුළු ළමයින් හා වැඩිහිටියන් සඳහා පැවැත්වූවා.
- ගැමි රඟ මඬල, සුරනර කෝලම්, අපේ කුරුළු ගී, පිං අකුණු වේදිකා තුනක් වැනි නාට්‍යය නිර්මාණ හා ''ද්වාර කර්ම'' නමින් කෙටි චිත්‍රපටයක් කලා.

ඔස්ට්‍රේලියාවේදී මොනවාද කරන්න බලාපොරොත්තු වෙන්නේ?

අපි නවසීලන්තයේදී ළමයින් සමඟ ගොඩාක් වැඩ කළා. මේ වගේ විදේශ රටවල හැදෙන වැඩෙන අපේ ළමයින්ට ශ්‍රී ලාංකික අපගේ සංස්කෘතිය කලාව ඉගැන්වූවා. ඒවායේ ආභාෂය ලබා දුන්නා. ඉතින් මෙහේදීත් ලබන වසරේ සිට එම වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. කලාවට කැමති වැඩිහිටියන් හා ළමයින් සමඟින්.
ඔබ වැනි ක්ෂේත්‍රයේ අත්දැකීම් බහුල අයගේ පැමිණීම මෙහි ජිවත් වන කලාව අගය කරන ශ්‍රී ලාංකිකයින්ට වැඩදායී වන බව නිසැකයි. ඉතින් ඔබ කරන්නට සිතන වැඩ කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරනවා.
ඔබට ජය ශ්‍රී




